www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යූඒඩබ්ලිව් ගිවිසුම් හරහා සිදු කල පාවාදීමේ දේශපාලන පාඩම්

**Political lessons of the UAW contract betrayal**

**කර්තෘ මන්ඩලය විසිනි**
**2007 නොවැම්බර් 19**

එක්සත් රථවාහන කම්කරු සංගමය (යූඒඩබ්ලිව්) හා ජෙනරල් මෝටර්ස්, ෆෝර්ඩ් හා ක්‍රයිස්ලර් යන ඩෙට්රොයිට් හි දැවැන්ත වාහන නිෂ්පාදකයන් තිදෙනා අතර ඇති වූ නව සිව් අවුරුදු කම්කරු ගිවිසුම්, රථවාහන කම්කරුවන් මුහුන පෑ විශාල පරාජයකි.

එක් අවධියක දී ලෝකයේ ඉහල ම වැටුප් ලැබූ නිෂ්පාදන කම්කරු වැයික්කියක් වූ එක්සත් ජනපද වාහන කර්මාන්තය, කම්කරුවන් 175,000 ආවරනය වන ගිවිසුම්වලින්, අඩ සියවසකට වැඩි කාලයක අරගලයේ ජයග්‍රහන අතුගා දමමින්, වහල් ශ්‍රම කොන්දේසි සහිත ලාභ ශ්‍රම මධ්‍යස්ථාන බවට පත් කරනු ඇත.

ශ්‍රේනි දෙකේ නව වැටුප් හා සහන ව්‍යුහයක් යටතේ සමාගම්වලට පැයක ශ්‍රම පිරිවැය සියයට 68න් කපා හැරීමට ඉඩ සලසන අතර අලුත් කම්කරුවන් පැයකට ඩොලර් 28.75 වෙනුවට 14.20ක් ද පහත් මට්ටමේ සහන ද ලබනු ඇත. මෙය, දසදහස් ගනන් නිපුන කම්කරුවන් වෙනුවට වඩාත් කුඩා හා වඩාත් උග්‍ර සූරාකෑමකට ලක් වන ශ්‍රම බලකායක් මගින් විස්ථාපනය කිරීමට මග සලසනු ඇත.

ගිවිසුම්වලින්, විශ්‍රාමික සෞඛ්‍ය පහසුකම් ගෙවීමේ ගැටලුවෙන් සමාගම් මුදාලනු ඇත. ඒ වෙනුවට, ස්වේච්ඡා සේවක ප්‍රතිලාභී සංගමයක් හෙවත් වෙබා නැමැති වෘත්තීය සමිති පාලිත විශ්‍රාමික සෞඛ්‍ය සේවා අරමුදලක් පිහිටුවනු ඇත. සමාගම් එයට දායක වන්නේ තමන් සතු ඩොලර් බිලියන 100 අධික සෞඛ්‍ය සේවා වගකීම්වලින් අඩකටත් අඩු ප්‍රමානයකිනි.

වටිනාකම ඩොලර් බිලියන 54.4ක් ලෙස තක්සේරු කර ඇති - ඇමරිකාවේ විශාලතම පෞද්ගලික ආයෝජන අරමුදල්වලින් එකක් - වෙබා අරමුදල්වල පාලනය යූඒඩබ්ලිව් වෙත පැවරේ. සමිතිවල දෙවැනි ගනයේ සෞඛ්‍ය පහසුකම් සැලැස්ම යටතේ විශ්‍රාමිකයන් සිය ප්‍රතිලාභ කැපීයාම හා වියදම ඉහල යෑම අත් විඳිනු ඇති අතර ඉහල යූඒඩබ්ලිව් නිලධරය පොහොසත් විධායකයන් බවට පත්වනු ඇත. වෙබා වෙත සැපයෙන අරමුදලින් විශාල පංගුවක් ව්‍යාපාර කොටස් බවට පරිවර්තනය කලහැකි නෝට්ටුවලින් සමන්විත වන අතර එමගින් යූඒඩබ්ලිව්, ජීඑම්, හා ෆෝර්ඩ් සමාගම්වල ලොකු ම කොටස් හිමියන් බවට පත් කෙරේ. ෆෝර්ඩ් සමාගම සම්බන්ධයෙන් ගත් කල එහි යූඒඩබ්ලිව් පංගුව ෆෝර්ඩ් පවුලේ කොටස මෙන් සිව් ගුනයක් වේ.

රැකියා වැටුප් හා ප්‍රතිලාභ කපා හැරීමට සහාය වීම සඳහා ලැබෙන සෘජු මූල්‍ය දිරිගැන්වීමක් සමග යූඒඩබ්ලිව් සමාගම්වලට තවත් සමීපව බද්ධ වනු ඇත. කම්කරුවන් සූරාකෑම උත්සන්න කිරීම සඳහා එකකට පසු තවෙකක් වශයෙන් සමාගම් සමග ව්‍යාපාරික කටයුතුවලට බැසීම යූඒඩබ්ලිව් හි පරිහානියේ අවසාන අවස්ථාව ය.

ජෙනරල් මෝටර්ස්, ෆෝර්ඩ් හා ක්‍රයිස්ලර් කර්මාන්ත ශාලා අඩු ම තරමින් 30ක් වත් වසා දැමීමට එකඟ වූවා සේ ම ඔවුන් ලොකු සමාගම් තුන විසින් තව දුරටත් රැකියා කැපීම හා ඔවුන්ගේ අමතර කොටස් නිපැයුම් අංශ වසාදැමීම සමග පසු ගිය තෙවසර තුල පමනක් රැකියා 150,000 අහෝසි කිරීමට ද සහයෝගය දුන්හ. නව ගිවිසුම මගින් අලෙවිය පහත වැටෙන සැමවිට ම කම්කරුවන්ට රැකියා අහිමි වන පරිදි, රැකියා අවස්ථාවන්ගේ මට්ටම් වෙලඳපොල ඉල්ලුමට වඩා සමීපව බද්ධ කිරීමට සමාගම්වලට ඉඩ සලසයි.

සමාගම් තුනට ම, නග්නව ම අපගාමී වූ එවන් ගිවිසුම් ඇති කර ගත හැකි වූයේ කෙසේ ද? මෙය පරාජය කර තලා දැමූ වැඩ වර්ජනවල ප්‍රතිඵලය නො වී ය. ඒ වෙනුවට යූඒඩබ්ලිව් සමිතියට සාමාන්‍ය කම්කරුවන්ගේ විරෝධය මැඩ කලමනාකරනයේ නිර්දේශය ක්‍රියාවට නැගීම සඳහා වාහන ලොක්කන් සමග කල කුමන්ත්‍රනයේ ප්‍රතිඵලයයි.

යූඒඩබ්ලිව් සම්බන්ධයෙන් පසු ගිය මාස දෙකේ "සාකච්ඡාවන්" සැබෑ නරුමත්වයේ ව්‍යායාමයකි. ජීඑම් හා ක්‍රයිස්ලර් සමාගම්වලට එරෙහිව සුලු වැඩ වර්ජන කැඳවීමක් මීට අයත් ය. යූඒඩබ්ලිව් සභාපති රොන් ගෙට්ල්ෆින්ගර් හදිසියේ ම වැඩ වර්ජනයක් නිවේදනය කල අවස්ථාව වන විටමත් ජීඑම් සමග ගිවිසුමක් ඇති කර ගෙන තිබූ බව ඩෙට්රොයිට් නිව්ස් වාර්තා කලේ ය.

සමාගමේ කුරිරු ඉල්ලීම්වලට එරෙහිව කම්කරුවන් ආරක්ෂා කිරීම සමග වර්ජනයට කිසිදු සම්බන්ධයක් නොවී ය. ඒ වෙනුවට, කලමනාකරනයෙන් සහන දිනාගෙන ඇති බවට යම් මවා පෑමක් සඳහා සමිතියට ඉඩ සලසන පරිදි කම්කරුවන්ගේ ශක්තිය මුදාහරින ක්‍රියාවන්ට අවස්ථාවක් නොදී ගිවිසුම් විකුනාගැනීමට නොහැකි වනු ඇතැයි යූඒඩබ්ලිව් නිගමනය කලේ ය.

කොන්ත්‍රාත්වලට එලඹීමේ ක්‍රියාවලිය පුරාවට ම යූඒඩබ්ලිව්, විශේෂයෙන් ම විනාශ භාග් වූ ඩෙට්රොයිට් වැනි ප්‍රදේශවල ආර්ථික භීතිකාව වපුරමින් ගිවිසුම්වල අන්තර්ගතය පිලිබඳව නිර්ලජ්ජිත ලෙස බොරු කීහ. ගිවිසුම් ප්‍රතික්ෂේප කලහොත් තවත් දහස් ගනන් රැකියා අහිමිවනු ඇතැයි සමිති නිලධරය තර්ජනය කලහ. මේ අතර අවශේෂ කම්කරුවන්ට කීවේ ඔවුන්ගේ කම්හල් "බේරාගෙන" ඇති බවත් හා අලුත් නිෂ්පාදන සහතික කර ඇති බවත්ය. මෙම ප්‍රකාශවල කිසිදු වැදගැම්මක් නොමැති බව පෙනීගියේ, ගිවිසුම් අනුමත කර දින ගනනාවක් ගතවීමත් සමග අතිරේක රැකියා දහස් ගනනක් කපා හැරීමේ සැලසුම් සමාගම් විසින් ප්‍රතික්ෂේප කිරීමත් සමග ය.

යූඒඩබ්ලිව්ට විවිධ වෘත්තීය සමිති විමතිකයන්ගේ සහාය ලැබුනි. යූඒඩබ්ලිව් 1700 ශාඛාවේ සභාපති බිල් පාකර් ද ඒ අතර වේ. ඔහු ගෙට්ල්ෆින්ගර් හා සොලිඩැරිටි මැදුරේ නායකත්වයට කිසිදු බැරෑරුම් අභියෝගයක් ඉදිරිපත් කලේ නැත. අව්‍යාජ විරුද්ධත්වයක් සංවිධානය කරනු වෙනුවට පාකර් ප්‍රකාශ කලේ අනුගාමිකත්වයේ බලපෑම හමුවේ නායකත්වයට සටන්වැදීමට සිදුවන බවයි. ඩෙට්රොයිට් හි ප්‍රාදේශීය කම්හල් හතරක තීරනාත්මක ඡන්දය ආසන්නයේ දී - මෙයට ඔහුගේ ශාඛාව ද ඇතුලත් ය - පාකර් යූඒඩබ්ලිව් ජාත්‍යන්තරයට කඩා වැටුනු අතර ඔහුගේ "නැත" යන කැඳවුම අතහැර දැමී ය.

ගිවිසුම්වලට එලඹීම සාමාජිකයන්ගේ ඡන්දයෙන් අනුමත කල එකක් නොවී ය. ජීඑම් හි තුනෙන් එකක් ද ක්‍රයිස්ලර් හි දෙකෙන් එකක් ද ෆෝර්ඩ් හි හතරෙන් එකක් ද ගිවිසුමට විරුද්ධව ඡන්දය දුන් අතර පැතිරුනු විරුද්ධත්වයක් දක්නට ලැබිනි. තවත් දස දහස් ගනනක් ඡන්දය දීමට පැමින නොසිටියහ. අනෙකුත් අය සටන් කිරීම සඳහා නායකයින් කිසිවක් නොකරන බව දන්නා නමුත් අකැමැත්තෙන් වුව ද එයට ඡන්දය පාවිච්චි කලහ.

කෙසේ වුව ද අවසානයේ දී ගිවිසුම් ගැසීම පිලිබිඹු කලේ, "ඇමරිකානු දේ මිලට ගන්න" යන ජාතිකවාදී උද්ඝෝෂනයන් ද කම්කරු-කලමනාකරන සහයෝගිත්වය ඔප්නැංවීම ද, පන්ති විඥ්ඥානයේ කවර රූපාකාරයකට හෝ එරෙහිව ඒකායන අරමුනකින් ගෙනගිය උද්ඝෝෂන ද මගින් යූඒඩබ්ලිව් නිලධරය දශක ගනනාවක් තිස්සේ සංවිධානය කල පාවාදීම් වාහන කම්කරුවන් මත ඇතිකල බලපෑම යි.

## යූඒඩබ්ලිව් කුමක් ද?

ගිවිසුම්වලට එලඹීම, කම්කරුවන්ට සිය අවශ්‍යතාවන් මෙම සංවිධානයේ රාමුව තුල ආරක්ෂා කර ගත නොහැකි බවට සාක්ෂි දරයි.

ඇමරිකානු ධනවාදයට සිය හිතපාක්ෂිකත්වය තිබිය දීත් අතීතයේ දී, යූඒඩබ්ලිව් හා ඒඑෆ්එල්-සීඅයිඕ පවත්නා ආර්ථික හා දේශපාලන පර්යායේ රාමුව තුල කම්කරුවන්ගේ වැටුප් හා සේවා තත්වයන් වැඩිදියුනු කිරීමට යම්තාක් දුරට උත්සාහ දරා තිබේ.

යූඒඩබ්ලිව් එම මධ්‍යස්ථ ක්‍රියාකලාපය අතහැර දමා කම්කරුවන්ගේ රැකියාවන්ට, ජීවන තත්වයන්ට හා සේවා කොන්දේසිවලට පහරදීමේ පිලිවෙත වැලඳගෙන තිස් වසරකට ආසන්න කාලයක් ගතවී තිබේ. මෙම කාලය තුල යූඒඩබ්ලිව් හි ඉහල මධ්‍යම පන්තික ස්තරයේ බලාධිකාරය, කලමනාකරනය සමග විවිධ ආයෝජන හා ව්‍යාපාරික ව්‍යාපෘතීන් ඇති කර ගැනීමකින් ඔවුන්ගේ ම ප්‍රතිපත්ති නිසා සමිති සාමාජිකයන් මත ඇති කල විනාශකාරී බලපෑම දැකගැනීමෙන් තෙමේ ම වලක්වනු ලැබිනි. එම ප්‍රතිපත්තිවලින් නිලධරයේ ආදායම ඉහල නැගීමට අවකාශ සැලසුනු අතර 1978 පටන් සමිතියේ සාමාජික සංඛ්‍යාව තුනෙන් දෙකකින් පහත වැටුනි.

මෙම ගිවිසුම් සනාථ කර ඇත්තේ පහලොස් වසරකටත් වැඩි කාලයක් තිස්සේ සමාජවාදී සමානතා පක්ෂයත් එහි පූර්වගාමී වර්කර්ස් ලීගයත් කියා ඇති දෙයයි. සිය රැකියා හා ජීවන තත්වයන් රැකගැනීම සඳහා වාහන කම්කරුවන් ගෙනයන ඕනෑ ම ශක්‍ය අරගලයක පූර්ව කොන්දේසිය, යූඒඩබ්ලිව්වෙන් විසංවාදී බෙදීමක් ද පන්ති අරගලය මුලුමනින් ම නව දේශපාලන පදනමක පනගැන්වීම ද වේ.

යූඒඩබ්ලිව්හි බිඳ වැටීම, එය ආරම්භයේ පටන් ම වාගේ වැලඳගෙන සිටි ප්‍රතිගාමී දේශපාලන ක්‍රියාමාර්ගයේ අනිවාර්ය ප්‍රතිඵලය විය. එය පදනම්ව තිබුනේ මූලික සංකල්ප දෙකක් මත යෑ ධනේශ්වර පද්ධතිය ආරක්ෂා කිරීම හා ජාතිකවාදය යි. සංවිධානයේ වත්මන් ස්වභාවය, සමාජවාදයට එරෙහිව හා ඇමරිකානු පාලක ප්‍රභූ තන්ත්‍රයේ අවශ්‍යතාවන්ට කම්කරු පන්තිය යටත් කිරීමේ පදනම මත අව්‍යාජ කම්කරු ව්‍යාපාරයක් ගොඩනොනැගිය හැකිය යන්නට නිදසුනකි.

1930 ගනන්වල සමිතිය ගොඩනැගූ මහජන අරගල මෙහෙයවන ලද සමාජවාදී වාමාංශික සටන්කරුවන් නෙරපා හල යූඒඩබ්ලිව් හි සභාපති වෝල්ටර් රුදර්ගේ 1940 හා 1950 ගනන්වල විරේක කිරීම් මෙම ප්‍රතිගාමී ගමන් මගෙහි අඩිතාලම දැමී ය. මහා ව්‍යාපාරිකයේ ආර්ථික හා දේශපාලන ආධිපත්‍යය

අවසන් කිරීමේ මොන ම අරගලයක් හෝ ප්‍රතික්ෂේප කරමින් රුදර්, යූඒඩබ්ලිව් ඩිමොක්‍රැටික් පක්ෂයට සන්ධාන ගත කලේ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන පක්ෂයක් ගොඩ නැගීමට විරුද්ධව ය.

ඩිමොක්‍රැටික් පක්ෂය වැඩ කරන මිනිසාගේ පක්ෂයක් ය යන මිථ්‍යාව දිනක් පාසා පුපුරා යන්නේ එය රිපබ්ලිකන් පක්ෂය සමග එක්ව යුද්ධය ගෙනයාමත්, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් වැනසීමත් සමාජ අසමානතාවය උත්සන්න කිරීමත් සමග ය.

වඩාත් කල්පනාකාරී කම්කරුවන් දැනටමත්, යූඒඩබ්ලිව් පිලිබඳව නිගමනයන්වලට එලඹ ඇති අතර විකල්පයක් සොයමින් සිටිති. මෙම කොන්දේසි යටතේ මධ්‍යම පන්තික "වාම" හා ලිබරල් සංවිධාන රොත්තක් යූඒඩබ්ලිව් නිලධරයේ ආරක්ෂාව සඳහා පෙල ගැසී සිටිති.

යූඒඩබ්ලිව්ට විරුද්ධ වීම නිසා මින් එක් සංවිධානයක් වන ස්පාටසිස්ට් ලීගය මෑතක දී සමාජවාදී සමානතා පක්ෂය හෙලා දැක්කේ "හොරිකඩ සමාජවාදීන්" ලෙස ය. මෙම කන්ඩායමට අනුව " කම්කරු පන්තියේ 'මූලික ම ආරක්ෂක සංවිධානය' වන්නේ වෘත්තීය සමිති ය." මෙම කුනු වූ සංවිධානවල බලපෑම බිඳ දැමීමට සටන්වදින සමාජවාදීන් "ජාතික අයිතියේ වැඩ කම්ටුවෙහි වෘත්තිය සමිති කඩන්නන්ට (හොරිකඩයන්ට) කිසි සේත් ම වෙනස් නො වේ.

මෙය වනාහි යූඒඩබ්ලිව් නිලධරය අමුඅමුවේ ම ආරක්ෂා කිරීම හැර වෙනදෙයක් නො වේ. මෙය කම්කරුවන් හා යූඒඩබ්ලිව් ව්‍යාපාරික විධායකයන් අතර ගැටුමක් බවට පත් වන විට ස්පාටසිස්ට්වාදීන් පලමුවැන්නාට එරෙහිව දෙවැන්න සමග පෙල ගැසෙති.

තමන්ගේ ම සාමාජිකයන් මත මෘග සූරාකෑමේ කොන්දේසි පටවන හා ඊට හිලව් වශයෙන් ඩොලර් බිලියන් ගනනක ආයෝජන අරමුදලේ හා සමාගමේ කොටස් මිලියන සියගනනක පාලනය හිමිකර ගන්නා සංවිධානය "කම්කරු පන්තියේ කුමන ආරක්ෂක සංවිධානයක් ද?" යූඒඩබ්ලිව් කම්කරු සංවිධානයක් නො වේ. එය කම්කරුවන්ගේ අවශ්‍යතාවන් නියෝජනය නොකරයි. එය කම්කරුවන්ට වග කියන්නේ හෝ ඔවුන් විසින් පාලනය කරන්නේ ද නො වේ.

කම්කරුවන් මෙම සංවිධානය තුල සිරවී සිටීම හෝ සමිතියේ ගාස්තු සිය පඩිපතින් අයකර ගැනීමේ හේතුව නිසා එය කම්කරු සංවිධානයක් බවට පත් වන්නේ නැත. යූඒඩබ්ලිව් ට මුක්කුව සපයන හා කම්කරුවන් සිය අරගල එය තුලින් ගෙන යා යුතු යයි අවධාරනය කරන්නන් කම්කරුවන් නිරායුධ කරමින් ප්‍රතිගාමී ක්‍රියා කලාපයක් ඉටු කරයි.

එවන් සංවිධාන ආරක්ෂා කිරීම මාරාන්තික අන්ධ භාවයේ හා දේශපාලන බංකොලොත් භාවයේ සලකුනක් පමනක් නො වේ. ස්පාටසිස්ට් වැනි කන්ඩායම් දිගු කාලයක් තිස්සේ කම්කරු ව්‍යාපාරය මත ආධිපත්‍යය දැරූ විවිධ නිලධාරි තන්ත්‍රයන්ට එරෙහි අරගලයට - ඔවුන් වෘත්තීය සමිති, ස්ටැලින්වාදී හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හෝ වේවා - විරුද්ධ වී තිබේ. ඒ වෙනුවට තම මධ්‍යම පන්තික "වාම" වර්ගයේ දේශපාලනය ගෙනයාම සඳහා ඔවුන් මත වාරු වී සිටිති.

මෑත වසර වල මෙම නිලධාරි තන්ත්‍රයන් බිඳ වැටුනු විට මෙම හිටපු රැඩිකලුන් බොහොමයක් " වාම දේශපාලනයේ සිට වෘත්තීය සමිති නිලධරයේ වාහකයන් ලෙස උපාධි ලබා ඇත. මෙහි දී ඔවුන් සිය දක්ෂිනාංශික ප්‍රතිපත්ති මුල් බැස්සවීමටත් පහලින් එන විරුද්ධත්වයට එරෙහිව සටන් කිරීමටත් කැප වී සිටිති.

එබැවින් ස්පාටසිස්ට්වරු කියා සිටින්නේ යූඒඩබ්ලිව් හි හා අනෙකුත් සමිතිවල එක ම දෝශය " නොමග ගිය නායකයන්" සිටීම බවයි. "නව වර්ගයක පන්ති අරගල කම්කරු පන්ති නායකත්වයකින්" ඔවුන් විස්ථාපනය කලහොත් - ඔවුන්ව හෝ වෙනත් හිටපු රැඩිකලුන්ගෙන් යයි අනුමාන කල හැකි - යූඒඩබ්ලිව් කම්කරුවන් සඳහා වූ බලගතු සටන් උපකරනයක් බවට පරිවර්තනය වනු ඇත.

මෙය තවත් වංචාවකි

යූඒඩබ්ලිව් හි පරිහානිය හුදෙක් දූෂිත හා බියගුලු නිලධාරින්ගේ නිර්මානයක් නො වේ. ඒවෙනුවට එවන් කොම්පැනි පක්කලියන් මුදුනට නැගීගන්නේ කම්කරු පන්තියේ දෘෂ්ටි ආස්ථානයකින් ගත් කල හරියට ම මෙම සමිති බොහෝ කාලයක සිට කුමන හෝ ප්‍රගතිශීලී අන්තර්ගතයකින් තොර වීම නිසාවෙනි.

පාවාදීම් යූඒඩබ්ලිව්ට පමනක් සීමාවන්නේ නම් එය එක් දෙයකි. එහෙක් සෑම සමිතියක් ම සිය සාමාජිකයන්ට එරෙහිව කම්කරු-කලමනාකරන සහයෝගිතාවයේ ගැලී සිටියි. තවද, මෙය හුදෙක් ඇමරිකානු ප්‍රපංචයක් ද නො වේ. රටක් රටක් පාසා සමිති, සිය සාමාජිකයන්ගෙන් සහන සලසන ලෙසත්, හාම්පුතුන් හා ආන්ඩු සමග තවත් සමීප සබඳතා ගොඩ නගාගන්නා ලෙසටත් බල කරති.

ධනේශ්වර නිෂ්පාදනයේ භුගෝලීයකරනය, වෘත්තීය සමිතිවලට මාරක ලෙස වල කපා තිබේ. ඒවායේ පූර්ව බලපෑම් බැදී තිබුනේ ජාතික ශ්‍රම වෙලඳපොලට බලපෑම් කිරීමට ඒවාට පැවති හැකියාව සමග ය. කම්කරුවන් ජාත්‍යන්තර සංගතයන්ගේ ගෝලීය මූලෝපායට හරස් කැපිය යුතු ය. ඔවුන් තම ජාත්‍යන්තර මූලෝපාය එක්සත් ජනපදයේ, කැනඩාවේ,

මෙක්සිකෝවේ, ලතින් ඇමරිකාවේ, යුරෝපයේ හා ආසියාවේ කම්කරුවන්, රැකියා හා ජීවන තත්වයන් ආරක්ෂා කිරීමේ පොදු අරගලයකට ඒකාබද්ධ කිරීම ලෙස ගත යුතු ය.

ජාතිකවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම් කල සියලු කම්කරු සංවිධාන හා සමිතිවල අභාවය පෙන්නුම් කරන්නේ වෘත්තීය සමිතිවාදයේ ආවේනික සීමාසහිතකම් ය. අවශ්‍යවන්නේ ජාත්‍යන්තරවාදී හා සමාජවාදී ඉදිරිදර්ශනයක් මත පදනම් වන කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයකි. අද දින කම්කරුවන් මුහුන දෙන කිසිදු ප්‍රශ්නයක්, හාම්පුතුන්ට හා ජාතික රාජ්‍යය මත බලපෑම් දැමීමේ වෘත්තීය සමිති සංකල්පයේ පදනම මත විසඳිය නොහැක.

ඒ වෙනුවට, කම්කරුවන් මුහුන දෙන්නේ බලය අල්ලාගැනීම හා ආර්ථික හා දේශපාලන ජීවිතය ධනවත් අතලොස්සකගේ නොව ඉමහත් බහුතරයකගේ අවශ්‍යතාවන් සඳහා ප්‍රතිසංවිධානය කිරීමේ දේශපාලන අරගලයකට ය. ගෝලීය වාහන කර්මාන්තයේ ගැබ්ව ඇති නිෂ්පාදන හා තාක්ෂනික සම්පත් - පරම්පරා ගනනාවක කම්කරුවන්ගේ කායික හා මානසික ශ්‍රමයේ නිෂ්පාදිතය වන - තව දුරටත් රක්ෂිත අරමුදල් කලමනාකරුවන්ගේ හා සමාගම් විධායකයන්ගේ පෞද්ගලික වත්කමක් විය නොහැකි ය. ඒවා, වාහන කර්මාන්තය පොදු අයිතිය හා වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ තැබීම මගින් සමස්තයක් ලෙස සමාජයේ ම ප්‍රයෝජනය සඳහා ගත යුතු ය.

මේ සඳහා වාහන කම්කරුවන්, මහා ව්‍යාපාරිකයේ පක්ෂ දෙකෙන් කැඩී වෙන්වීම ද, ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත නව දේශපාලන පක්ෂයක් ගොඩ නැගීම ද අවශ්‍ය කෙරේ. එම පක්ෂය නම් සමාජවාදී සමානතා පක්ෂයයි.

අප, වාහන කම්කරුවන්ගෙන් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙසත්, ක්‍රියාමාර්ගය අධ්‍යයනය කරන ලෙස හා සමාජවාදී සමානතා පක්ෂයේ ඉතිහාසය ගැන තමන්ම දැනුවත් වන ලෙසත් සසපයට බැඳීමේ හා කම්කරු පන්තියේ නව විප්ලවකාරී නායකත්වය ලෙස එය ගොඩ නැගීමේ තීරනය ගන්නා ලෙසත් ඉල්ලා සිටිමු.

© www.wsws.org